# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2115/49 – 2019 මාර්තු 22 වැනි සිකුරාදා – 2019.03.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/78.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඒ. කරුණාරත්න මයා ඇතුළු සේවක පිරිස, කොටුහේන, මදුරාගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්, අංක 561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මේල්පිටිය, අංක 75, එස්. කාරියවසම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවින්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

1A – G 29712 – 21 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2018/78.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඒ. කරුණාරත්න මයා ඇතුළු සේවක පිරිස, කොටුහේන, මදුරාගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්, අංක 561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''2013 ජුනි මාසයට පෙර බඳවා ගෙන ඇති සේවකයින්ට ගෙවනු ලබන විශේෂ දීමනාව 2013 ජුනි මාසයෙන් පසු බඳවා ගනු ලැබූ ඒ. ඒ. කරුණාරත්න මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 08 දෙනාට හිමි ද? කිසිදු හේතුවකින් තොරව 2013 ජුනි මාසයෙන් පසුව නොගෙවා සිටීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

01. ඒ. ඒ. කරුණාරත්න
02. කේ. ඩී. ඒ. සුනිල් ප්‍රේමතිලක
03. ඩබ්. ඒ. එන්. දයාරත්න
04. කේ. ඩී. ඒ. නිමල් රාජරත්න
05. ඒ. යූ. විජේසිංහ
06. එස්. ඩී. කරුණාසේන
07. ආර්. ඩී. විලියොම්
08. කේ. එම්. එන්. එස්. කෝනාර

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

04 – 189

---

මගේ අංකය: IR/COM/04/2018/104.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල් මයා, අංක බී/340/1, ගැමුණුපුර, අම්පාර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මැණික්දිවෙල, ශ්‍රී පේමරතන මාවත, අංක 22/1, එස්. ජී. සූරියආරච්චි මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/104.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල් මයා, අංක බී/340/1, ගැමුණුපුර, අම්පාර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරෙකු ලෙස සේවය කරන ලද කේ. ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල් මහතාහට 2015.12.02 දින සිට විනය චෝදනා මත වැඩ තහනමට ලක්ව සිටි මාස 09 ක කාලය සඳහා වැටුප් නොගෙවීමෙන් ද, බස් රථයේ අලාභය අයකර ගැනීමෙන් ද, ඇතුළු වෙනත් ප්‍රතිලාභ අහිමි කිරීමෙන් ද, අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 – 190

---

මගේ අංකය: IR/COM/02/2018/112.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. ජී. ආර්. එස්. ගුණරත්න මයා, අංක 172, පොල්වත්ත පාර, පමුණුව, මහරගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/112.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. ජී. ආර්. එස්. ගුණරත්න මයා, අංක 172, පොල්වත්ත පාර, පමුණුව, මහරගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''විනය චෝදනාවකට අදාළව පැවති මූලික විමර්ශනයෙන් නිවැරදිකරු වී ඇති අයි. ජී. ආර්. එස්. ගුණරත්න මහතාව නැවත සේවයේ පිහිටුවීමේ දී මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වවුනියාවේ පිහිටුවීමට යෝජිතව තිබූ උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත කිරීමෙන්, අයි. ජී. ආර්. එස්. ගුණරත්න මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද? අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 – 191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.